**2017 - සමෘද්ධි අරමුදල**

----------------------------

සමෘද්ධි අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශය**

**2.1** **තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ප්‍රමිත අංක 03 හි 07 වැනි ඡේදය ප්‍රකාරව ගනුදෙනු අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන අදාළ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වුවද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පවත්වාගෙන යන ගොඩනැඟිලි 1286 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,432,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට උපලබ්ධි වූ සත්‍ය ආදායම රු. 7,507,000 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2** **ගිණුම් ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති සටහන් (i) යටතේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සකස් කර ඇති බව දක්වා ඇති නමුත් සටහන් අංක (iv) යටතේ සමෘද්ධි බැංකු/ බැංකු සමිතිවලින් ගොඩනැඟිලි කුලී ලෙස වාර්ෂිකව අයකරනු ලබන මුදල්, උපලබ්ධි වූ සත්‍ය ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කරනු ලබන බව දක්වා තිබුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 25,075,971 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2014 වර්ෂයේදී දැයට කිරුළ වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික්ක 03 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මහාභාණ්ඩාගාරයෙන් නැවත ප්‍රතිපූරණය කරගත හැකිය යන පදනම මත රු. 212,000,000 ක ණය මුදලක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අරමුදලෙන් ලබා දී තිබුණි. 2018 ජනවාරි 02 දිනැති BD/RDS/331/01/01 ලිපියෙන් එම ගෙවීම සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරයෙන් ලිඛිත අනුමැතියක් ලබා දී නොමැති බැවින් මෙම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාවක් නොමැති බව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් දන්වා එවා තිබුණි.

**2.4** **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව | 2017 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනයේ තැන්පත් කල නමුත් උපලබ්ධිනොවූ රු. 72,000 ක් වූ චෙක්පත් 8 ක් මාස 11 ක සිට මාස 16 ක කාලයක් ගතවී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.127,501,983 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 114,506,350 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 242,008,333 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීමට හාරගම ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට රු. මිලියන 300 ක් වැයකර තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

කුණ්ඩසාල හාරගම ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම් කෙටිකාලීන විසඳුම් සඳහා 2017 නොවැම්බර් මස රු. මිලියන 300 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට ලබා දී තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී නොතිබුණි. මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට, මහනුවර කුණ්ඩසාල (සෙංකඩගල) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ගම්මාන 14 ක පවුල් 6,000 ක් පීඩා විඳින ජල ප්‍රශ්නයට විසඳුමක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද 2022 ජනවාරි 25 දින වන විටත් මෙම ව්‍යාපෘතිය මගින් සෘජුවම ජල සැපයුම ලබාදී තිබුණේ අනුරගම ප්‍රදේශයේ පවුල් 428 කට එනම් සියයට 7 කට පමණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල්වල ඇතුලත් එකතුව රු. 17,147,844 ක් වූ කෘෂි, ධීවර හා සත්ව පාලන ව්‍යාපෘති සඳහා සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට 2007 දක්වා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සමෘද්ධි අධිකාරිය මගින් නැවත අයකිරීමේ පදනම මත ප්‍රතිලාභීන්ට චක්‍රීය පදනම මත ලබා දුන් ණය වලින් ලැබිය යුතු වටිනාකම විය. මෙම ණය

අයකිරීම් 2007 ජුලි 16 දිනැති අංක ස/අධි/10/ජාස.ගම්/ චක්‍රීය අරමුදල දරන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ‘‘ගම් පුබුදු ජීවනෝපාය චක්‍රීය’’ ගිණුමට බැර කිරීමට නියෝගකර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වාර්තා ඉදිරිපත් වීමක් හෝ ණය මුදල් පියවීමක් සිදු වී නොතිබුණි.

(ආ) අරමුදලේ පරමාර්ථය වූ ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති ගොඩනැගීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරිම සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති වලින් ගොඩනැගිලි කුලී ගෙන්වා ගැනීම, එකී බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි නඩත්තු කිරීමට නවීකරණයට හා නව ගොඩනැඟිලි ආරම්භ කිරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් බැහැරව අවශ්‍ය මූල්‍ය දායකය සැලසීම දක්වා තිබුණද 2017 ජුනි 9 දිනැති සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක 2017/7 දරන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව මෙම අරමුදලට මෙතෙක් බැරකරන ලද ගොඩනැගිලි කුලී සමෘද්ධි අරමුදලට බැර නොකරන ලෙසත් 2017 වර්ෂයේ සිට සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති විසින් එම මුදල් තමාගේම “ බැංකු ගොඩනැගිලි සංවර්ධන හා නඩත්තු අරමුදල් ගිණුම” කට බැර කරන ලෙසත් අදාළ ගිණුම් සටහන් තැබිය යුතු ආකාරයත් දක්වා චක්‍රලේඛය නිකුත් කර තිබුණි. ඒ අනුව මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු හා කළමනාකරණ තිරණ පිළිබඳව මතභේදාත්මක තත්ත්වයක් ඇතිවන බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තීරණයට එළඹීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති 1,286 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,432,000 ක් වුවත් ලැබුණු ආදායම රු. 7,507,000 ක් පමණක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2019 අප්‍රේල් මස ද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2021 නොවැම්බර් 08 දින ද ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

අරමුදල ව්‍යවස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.